*සැ. යු.-* 2016.06.10 දින පළ වූ අංක 1971 දරන *ගැසට් පත්‍රයේ* III සහ IV(අ) කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,972 - 2016 ජුනි මස 17 වැනි සිකුරාදා - 2016.06.17**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 946 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 954 |

*සැ. යු.-* ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව පනත් කෙටුම්පත 2016 අප්‍රේල් මස 22 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 ජූලි මස 08 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2016 ජුනි මස 24 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති (වැ. බ.)

2016 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

943- B 81068 — 5,403 (2016/06)
B 1 -

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්ලොටින් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පෙ-ාතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙ-වත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලා-වකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — ගම්පහ දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2016 ජූලි මස 18 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2016 මැයි මස 30 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවිය යුතු කොට්ඨාසය* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| ගම්පහ | ජාඇල | රාගම රෝහල් කොට්ඨාසයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගම්පහ. |

06-448

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — මහනුවර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවලට අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකිය.

03. ඉල්ලුම්කරුවන් වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2016 ජූලි මස 18 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2016 මැයි මස 30 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| මහනුවර | උඩුනුවර | උඩුනුවර හා යටිනුවර කොට්ඨාසයේ ඇල්පිටිය හා ගෙලිඔය ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර |

06-447

---

**නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය**

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

*බඳවා ගැනීමේ පොදු සුදුසුකම් :*

සෑම අපේක්ෂකයෙක්ම-

(*අ*) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
(*ආ*) තනතුරට පැවරෙන කාර්යන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්තවිය යුතුය.
(*ඇ*) විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

**අධ්‍යක්ෂ (ඉංජිනේරු) - පුරප්පාඩු - 01**

අධ්‍යාපන සුදුසුකම් :

(*අ*) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් සිවිල් ඉංජිනේරු විෂය පිළිබඳ විද්‍යාපති උපාධියක් ලබා තිබීම;

*හෝ*

(*ආ*) වරලත් ඉංජිනේරු ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම;

*සමග*

(*ඇ*) උපාධිය ලබා ගැනීමෙන් පසුව රජයේ හෝ රාජ්‍ය ආයතනයක හෝ රජය පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර 10 ක පළපුරුද්දක් තිබීම.

වයස .- අවු. 35 ට නොඅඩු හා අවු. 55 ට නොවැඩි අය විය යුතුය.
*වැටුප් පරිමාණය* .- HM 1-1-2006 රු. 38,530 -15 x 1,100 - රු. 55,030
*දීමනා* - රජයේ අනුමත අනෙකුත් දීමනා

**අධ්‍යක්ෂ (සැලසුම් සහ තොරතුරු කළමනාකරණ පද්ධති) පුරප්පාඩු - 01**

*අධ්‍යාපන සුදුසුකම්* :

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය, සංඛ්‍යානය, පරිගණක විද්‍යාව විෂයය ඇතුළත්ව ලබාගත් උපාධියක් තිබීම,

සමඟ

(ආ) උපාධිය ලබාගැනීමෙන් පසු රජයේ හෝ රාජ්‍ය ආයතනයක හෝ රජය පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර 15ක පළපුරුද්දක් තිබීම.

*වයස* : අවු. 35 ට නොඅඩු හා අවු. 55 ට නොවැඩි අය විය යුතුය.
වැටුප් පරිමාණය : HM 1-1-2006 - රු.38,530 - 15x1,100- රු. 55,030

*දීමනා* - රජයේ අනුමත අනෙකුත් දීමනා

**සහකාර අධ්‍යක්ෂ (ඉංජිනේරු) - පුරප්පාඩු -** 01

*අධ්‍යාපන සුදුසුකම්* :

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් සිවිල් ඉංජිනේරු පිළිබඳ උපාධිය;

හා/හෝ

(ආ) උපාධිය ලබා ගැනීමෙන් පසු/වෘත්තීය ආයතනයේ සාමාජිකත්වය ලබාගැනීමෙන් පසු රජයේ හෝ රාජ්‍ය ආයතනයක හෝ රජය පිළිගත් පෞද්ගලික ආයතනයක ඉංජිනේරු ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 03 ක සේවා පළපුරුද්දක් තිබීම.

*වයස* .- අවු. 25 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි අය විය යුතු ය.

*වැටුප් පරිමාණය* .- MM 1-1-2006 - රු. 25,640 - 3 x 665 - 7 x 735-15 x 925 - රු. 46,655

*දීමනා* .- රජයේ අනුමත අනෙකුත් දීමනා

**පරිපාලන නිලධාරි - පුරප්පාඩු** - 01

*අධ්‍යාපන සුදුසුකම්* :

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඕනෑම විෂය ක්ෂේත්‍රයකින් ලබාගත් උපාධියක්

සමඟ

රජයේ හෝ රාජ්‍ය ආයතනයක හෝ රජය පිළිගත් පෞද්ගලික ආයතනයක මානව සම්පත් කළමනාකරණය පිළිබඳ අවම වශයෙන් වසර 01 ක පළපුරුද්දක් තිබීම.

*වයස* .- අවු. 25 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි අය විය යුතුය.
වැටුප් පරිමාණය : JM1-1-2006 A – රු. 20,525-10x365- 18 x 550 – රු. 34,075
*දීමනා* .- රජයේ අනුමත අනෙකුත් දීමනා

**තාක්ෂණික නිලධාරි- පුරප්පාඩු 01**

අධ්‍යාපන සුදුසුකම් :

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් සිවිල් ඉංජිනේරු/ප්‍රමාණ සමීක්ෂණ/සැලසුම් ශිල්පය ඇතුළත්ව ලබාගත් විද්‍යාවේදී උපාධිය

සමග

(ආ) රජයේ හෝ රාජ්‍ය ආයතනයක හෝ රජය පිළිගත් පෞද්ගලික ආයතනයක තාක්ෂණ කටයුතු පිළිබඳ අවම වශයෙන් වසර 01ක පළපුරුද්දක් තිබීම.

*වයස* .- අවු. 25ට නොඅඩු හා අවු. 45ට නොවැඩි අය විය යුතුය.

*වැටුප් පරිමාණය* .- JM 1-1-2006A-20,525-10x365- 18x550 - රු. 34,075

*දීමනා* .- රජයේ අනුමත අනෙකුත් දීමනා

**පද්ධති විශ්ලේෂක - පුරප්පාඩු - 01**

*අධ්‍යාපන සුදුසුකම්* :

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් පරිගණක විද්‍යාව/සංඛ්‍යානය/ තොරතුරු තාක්ෂණය/පරිගණක හා කළමනාකරණය සහ නගර සහ ග්‍රාම නිර්මාණ විෂයය ඇතුළත්ව ලබා ගත් උපාධිය

*වයස* .- අවු. 22 ට නොඅඩු හා අවු. 35 ට නොවැඩි අය විය යුතුය.
*වැටුප් පරිමාණය* : MA 5 -1-2006 A-රු. 16,890-10 x 320 -15 x 365 -11 x 450 - රු. 30,515
*දීමනා* .- රජයේ අනුමත අනෙකුත් දීමනා

**දත්ත සැලසුම් සහකාර - පුරප්පාඩු - 01**

*අධ්‍යාපන සුදුසුකම්* :

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් පරිගණක විද්‍යාව/ සංඛ්‍යානය/ තොරතුරු තාක්ෂණය/ පරිගණක හා කළමනාකරණය සහ නගර සහ ග්‍රාම නිර්මාණ විෂයය ඇතුළත්ව ලබා ගත් උපාධිය

වයස .- අවු. 22 ට නොඅඩු හා අවු. 35 ට නොවැඩි අය විය යුතුය.
*වැටුප් පරිමාණය* MA : 5 -1-2006 A – රු. 16,890-10x320 -15x365 -11x450 -රු. 30,515
*දීමනා* .- රජයේ අනුමත අනෙකුත් දීමනා

**ප්‍රජා සංවර්ධන සහකාර** **පුරප්පාඩු - 03**

*අධ්‍යාපන සුදුසුකම්* :

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඕනෑම විෂය ක්ෂේත්‍රයකින් ලබාගත් උපාධියක්,

*වෙනත් සුදුසුකම්* :
වෘත්තිය සමාජ වැඩ පිළිබඳ පූර්ණ කාලීන දෑ අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව හෝ රජය පිළිගත් ආයතනයකින් කෘෂිකර්මය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය/සමාජ විද්‍යා විෂය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම.

*වයස* .- අවු. 22 ට නොඅඩු හා අවු. 35 ට නොවැඩි අය විය යුතුය.
*වැටුප් පරිමාණය* : MA 3-2006 A – රු. 15,600-10x215 -4x240 -15x320 -7x360 -රු. 26,030
*දීමනා* .- රජයේ අනුමත අනෙකුත් දීමනා

**නීති සහකාර** **පුරප්පාඩු - 01**

*අධ්‍යාපන සුදුසුකම්* :

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් නීති විෂයයක් ඇතුළත්ව ලබාගත් උපාධියක්,

වයස .- අවු. 22 ට නොඅඩු හා අවු. 35 ට නොවැඩි අය විය යුතුය.
*වැටුප් පරිමාණය* .- MA 3-2006 A - 15,600-10x215 -4x240 -15x320 -7x360 -රු. 26,030
*දීමනා* .- රජයේ අනුමත අනෙකුත් දීමනා

**තාක්ෂණික සහකාර** **පුරප්පාඩු - 01**

*අධ්‍යාපන සුදුසුකම්* :

(අ) භාෂාව හෝ සාහිත්‍ය,ගණිතය සහ විද්‍යාව ඇතුළුව විෂයයන් 06කින් අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය සමත්වීම ;

සහ

*වෘත්තීය කුසලතා* :

(අ) තෘතීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නියම කර ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතා (NVQ) 05 වන මට්ටමට නොඅඩු මට්ටමක තිබෙන,

(i) තාක්ෂණ විද්‍යා ජාතික ඩිප්ලෝමා සහතිකය (සිවිල් ඉංජිනේරු) ; හෝ

(ii) උසස් ජාතික ඩිප්ලෝමාව (ඉංජිනේරු) සහතික ලබා තිබීම ; හෝ

(iii) ජාතික තාක්ෂණික සහතිකය (ඉංජිනේරු/ප්‍රමාණ සමීක්ෂණය) හෝ ඒ හා සමාන රජයේ පිළිගත් තාක්ෂණික ආයතනයක සිවිල් ඉංජිනේරු සහතිකය/ප්‍රමාණ සමීක්ෂණ සහතිකය ලබා තිබීම.

*වයස* : අවු. 18 ට නොඅඩු හා අවු. 35 ට නොවැඩි අය විය යුතුය.
*වැටුප් පරිමාණය* .- MA 2.1-2006 A - රු. 14,610-10x145-7x170-4x240-20x320-රු. 24,610
*දීමනා* .- රජයේ අනුමත අනෙකුත් දීමනා

**සමාජ සංවර්ධන සහකාර** **පුරප්පාඩු - 01**

*අධ්‍යාපන සුදුසුකම්* :

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව, ගණිතය හා ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථය සමග එකවර විෂයයන් හයක් (06) සමත් වී තිබීම ;

සහ

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී පැරණි විෂය නිර්දේශය අනුව විෂයයන් (04) හෝ නව විෂය නිර්දේශය අනුව විෂයයන් තුනක් (03) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත්ව තිබීම ;

සහ

(ඇ) ජාතික සමාජ සංවර්ධන ආයතනය මගින් පිරිනමනු ලබන වෘත්තීය සමාජ වැඩ පිළිබඳ පූර්ණ කාලීන දෑ අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව සමත්වීම.

*වයස* : අවු. 18 ට නොඅඩු හා අවු. 30 ට නොවැඩි අය විය යුතුය.
*වැටුප් පරිමාණය* .- MA1.1-2006A - රු. 13,450-10x145-7x170-4x240-20x320-රු. 23,450
*දීමනා* .- රජයේ අනුමත අනෙකුත් දීමනා

රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යාවස්ථාපිත මණ්ඩල වල දැනටමත් සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ අයදුම්පත් ස්වකීය අදාළ ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් යොමුකළ යුතුය. අයදුම්කරුවන්ගේ සම්පූර්ණ ජීවදත්ත ඇතුළත් තමා විසින් සකසාගත් අයදුම්පතක් පහත සඳහන් ලිපිනයට 2016.06.17 දින සිට දින 14 ක් ඇතුළත ලැබෙනසේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

**සැලකිය යුතුය.-**
මෙහි ඇතුළත් වැටුප් විස්තරය කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 අනුව සංශෝධනයවීමට නියමිතය.

අධ්‍යක්ෂ ජනරාල්,
නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය.

09 වන මහල
සෙත්සිරිපාය, බත්තරමුල්ල,
දුරකථන : 011-2871305, ෆැක්ස් : 011-2884131
ඊමේල් - admnusda@gmail.com

06-625

## අධිකරණ අමාත්‍යාංශය

### නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ සහකාර ලේකම් තනතුර සඳහා බඳවා ගැනීම - 2016

නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ පවතින සහකාර ලේකම් තනතුරු 02ක් සඳහා සුදුස්සන් තෝරා ගැනීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර ''ලේකම්, අධිකරණ අමාත්‍යාංශය, උපරිමාධිකරණ සංකීර්ණය, කොළඹ 12'' යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. කවරයේ වම්පස ඉහළ කෙළවරේ ''නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ සහකාර ලේකම් තනතුර සඳහා බඳවා ගැනීම'' යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතු ය.

අයදුම්පත් කැඳවන අවසාන දිනය 2016.07.18 දින වේ.

*සටහන.*—ඉල්ලුම්පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතු ය.

01. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :*

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්‍ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්‍ෂණයක් මගින් ලබා දෙන ලකුණු මත තෝරා ගනු ලබයි. පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය අනුව තීරණය කරනු ලැබේ.

02. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය.

(ii) මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරියකු වසර 03ක පරිවාස කාලයකට යටත් වන අතර, එම වසර 03 ඇතුළත පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

(iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට අනුෂංගික චක්‍රලේඛ අනුව භාෂාව පිළිබඳ ප්‍රවීණතා මට්ටම වසර 05ක් තුළ දී ලබා ගත යුතු ය. රාජ්‍ය භාෂාවක් නොවන මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් වසර 03ක් තුළදී එක් රාජ්‍ය භාෂාවක් පිළිබඳව ප්‍රවීණතාවය ලබාගත යුතු අතර, අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය වසර 05ක් ඇතුළත ලබාගත යුතු ය.

(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

03. *වැටුප් පරිමාණය :*

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 දරන චක්‍රලේඛයට අනුව SL-1-2016, රු. 47,615 - 10 x 1335 - 8 x 1630 - 17 x 2170 - රු. 110,895 ක මාසික වැටුප් පරිමාණයක් හිමි වේ. (2016/02/25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016හි විධිවිධාන අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වැටුප් හිමි වේ.)

04. *සුදුසුකම් :*

(i) අධ්‍යාපන සුදුසුකම් :

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් නීතිවේදී උපාධියක් ලබා තිබීම හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වීම; සහ
- අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමාර්ථ ලබා තිබීම.

(ii) වෘත්තීය සුදුසුකම් :

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු වසර 03කට නොඅඩු සක්‍රීය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.

05. *වයස් සීමාව :*

අයදුම්පත් භාරගන්නා දිනට වයස අවු. 21ට නොඅඩු, උපරිම අවු. 35ට නොවැඩි විය යුතු ය. (දැනටමත් රජයේ සේවයේ නියුතු නම් උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

06. *කායික සුදුසුකම් :*

සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

07. *වෙනත් සුදුසුකම් :*

(i) අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු ය.

(ii) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

(iii) මනා ලෙස ඉංග්‍රීසි භාෂාව හැසිරවීමට හැකි විය යුතු ය.

(iv) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/*ගැසට්* නිවේදනයේ සඳහන් කරනු ලබන අවසන් දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

08. *ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :*

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ලකුණු ලබා දෙනු ලබන අතර එම පරීක්ෂණයේ දීම සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ.

09. සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබාදීමේ ක්‍රමය :

| *අනු. අංකය* | *ලකුණු ලබාදිය යුතු ක්ෂේත්‍ර* | *ලකුණු* | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| 01. | **සාමාන්‍ය නීති මූලධර්ම :** | | |
| | (i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන නීතිය පිළිබඳ උපාධියෙහි, | | |
| | - පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා | 25 | |
| | - දෙවන පන්තියේ ඉහළ සාමාර්ථයක් සඳහා | 20 | |
| | - දෙවන පන්තියේ පහළ සාමාර්ථයක් සඳහා | 15 | |
| | (ii) ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ අවසන් වසර විභාගය - පළමු පෙළ සාමාර්ථයක් සඳහා | 20 | 25 |

| අනු. අංකය | ලකුණු ලබාදිය යුතු ක්ෂේත්‍ර | ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| | (iii) ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ අවසන් වසර විභාගය දෙවන පෙළ සාමාර්ථයක් සඳහා (ලකුණු ලබා දෙනු ලබන්නේ උපාධිය හෝ නීති විද්‍යාලයේ අවසන් වසරේ පරීක්ෂණය යන දෙකෙන් ලබා ඇති ඉහළම සුදුසුකමට පමණි.) | 15 | |
| 02. | **භාෂා ප්‍රවීණතාව :** | | |
| | (i) උපාධිය, පශ්චාත් උපාධිය, නීතිවේදී පාඨමාලාව, පශ්චාත් නීති පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදරා තිබීම. (අදාළ විභාග ප්‍රශ්න පත්‍ර සියල්ල සඳහා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පිළිතුරු සපයා තිබිය යුතුය.) | 10 | |
| | (ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ රජය පිළිගත් ආයතනයකින් ලබාගත් ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමාව (පාඨමාලාවේ කාලසීමාව මාස 06කට නොඅඩු වූ/පැය720) | 05 | 10 |
| | (iii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ රජය පිළිගත් ආයතනයකින් ලබාගත් ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (පාඨමාලාවේ කාලසීමාව මාස 03කට නොඅඩුවූ/පැය 360) | 03 | |
| 03. | **අතිරේක අධ්‍යාපන සුදුසුකම් :** | | |
| | (i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ශ්‍රී ලංකා නීති විද්‍යාලය මඟින් පිරිනමනු ලබන පශ්චාත් නීතිවේදී උපාධිය (LLM) | 30 | |
| | (ii) පාඨමාලාවේ කාලසීමාව එක් වසරකට නොඅඩු වූ නීති ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (එක් ඩිප්ලෝමාවකට ලකුණු 05 බැගින්) | 20 | 30 |
| | (iii) පාඨමාලවේ කාලසීමාව මාස 06කට නොඅඩු වූ පශ්චාත් නීති ඩිප්ලෝමාව (එක් ඩිප්ලෝමාවකට ලකුණු 03 බැගින්) | 10 | |
| 04. | **තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම :** | | |
| | (i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත ආයතනයකින් ලබාගත් තොරතුරු තාක්ෂණ විෂය ප්‍රධාන විෂයක් ලෙස ඇතුළත් වූ උපාධිය | 15 | |
| | (ii) මාස 06කට/පැය 720කට නොඅඩු පාඨමාලා කාලයක් සහිත රජයේ පිළිගත් ආයතනයකින් ලබාගත් තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව | 10 | 15 |
| | (iii) මාස 03කට නොඅඩු පාඨමාලා කාලයක් සහිත රජය පිළිගත් ආයතනයකින් ලබාගත් තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | 05 | |
| 05. | **අතිරේක පළපුරුද්ද :** | | |
| | (i) රාජ්‍ය සේවයේ හෝ පෞද්ගලික අංශයේ නීතිඥවරයකු ලෙස ලබා ඇති පළපුරුද්ද<br>(අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් මූලික සුදුසුකම වන අවුරුදු 03ක සේවා පළපුරුද්දට අමතරව නීතිඥයකු ලෙස ලබා ඇති පළපුරුද්ද මෙහි දී සලකා බලනු ලැබේ. එක් වසරකට ලකුණු 03 බැගින් උපරිම ලකුණු 15කි.)<br>(විනිසුරුවරයෙකුගෙන් හෝ ජනාධිපති නීතිඥවරයෙකුගෙන් හෝ අවුරුදු 20කට නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නීතිඥවරයෙකුගෙන් හෝ ලබාගත් සහතිකයක් මඟින් පළපුරුද්ද සනාථ කළ යුතුය.) | වසරකට ලකුණු 03 බැගින් | 15 |
| 06. | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය | | 05 |
| | **එකතුව** | | **100** |

10.(I) ඉල්ලුම්පත්‍රය සෙ. මී. 22-29 ප්‍රමාණයේ A4 කඩදාසිවල සකස් කළ යුතු අතර, 1 - 14 තෙක් ශීර්ෂ පළමුවන පිටුවට ද, 15 සිට අවසන් වන තෙක් ශීර්ෂ දෙවන පිටුවට ද වන ලෙස ගෙන සකස් කළ යුතුය. ඊට අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිළිව ඇතුළත් කළ යුතුය. සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන, මූලික සුදුසුකම් නොමැති, නියමිත දිනට පසුව ලැබෙන හා ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදළ ඉල්ලුම් පත්‍රයේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තව ද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම් පත්‍රය නිවේදනයේ සඳහන් ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු බවත්, එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප වන බවත්, වැඩිදුරටත් දන්වමි. ඉල්ලුම්පත මේ සමඟ ඇති ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුව සැකසිය යුතුය. ඉල්ලුම්පත්‍ර ලැබුණු බව දන්වනු නොලැබේ.

*සැළකිය යුතුය.*— (*අ*) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපත් නොඇමිණිය යුතු ය.

(*ආ*) ඉල්ලූ අවස්ථාවකදී ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයින් අයදුම්පත්‍ර ගැන සලකා බලනු නොලැබේ.

(II) රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ, රාජ්‍ය සංස්ථාවල සේවයේ නියුක්ත නිලධාරින් විසින් තමන්ගේ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා මාර්ගයෙන් අයදුම්පත්‍ර එවිය යුතු ය.

11. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, කලින් කලට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ හා නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ විධායක සේවා ණය සඳහා වන බඳවා ගැනීමේ පරිපාටියේ කොන්දේසි මෙම තනතුර සඳහා අදාළ වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

පද්මසිරි ජයමාන්න,
ලේකම්,
අධිකරණ අමාත්‍යාංශය.

2016 ජුනි මස 02 වැනි දින.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***රාජ්‍ය සේවා කොමිෂන් සභාව***

අධිකරණ අමාත්‍යාංශය

| |
|---|
| අංකය :————. |
| (කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා) |

*නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ විධායක සේවා ශ්‍රේණියේ III ශ්‍රේණියේ සහකාර ලේකම් තනතුර සඳහා අයදුම්පත්‍රය*

01. (*අ*) මුලකුරු සමඟ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.
මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :———

(*ආ*) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.
සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

02. ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.

03. ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

04. දුරකථන අංකය :————.

05. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | |

06. ස්ත්‍රී/පුරුෂ භාවය :————.

07. උපන් දිනය : වර්ෂය :———. මාසය :———. දිනය :———.

08. ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස ඃ

වර්ෂ :———. මාස :———. දින :———.

09. ජාතිය :————.

10. විවාහක/අවිවාහක බව :————.

11. නීති උපාධිය පිළිබඳ විස්තර ඃ
විශ්ව විද්‍යාලය :————.
උපාධිය පිරිනැමූ දිනය :————.
භාෂා මාධ්‍ය :————.

12. නීතිඥයකු ලෙස දිවුරුම් දුන් දිනය :————.

13. නීතිඥයකු ලෙස වෘත්තීය පළපුරුද්ද ඃ වසර ගණන :————.

14. අ. පො. ස. (සා. පෙළ) විභාග ප්‍රතිඵල ඃ-

විභාග අංකය :———.
විභාගයට පෙනී සිටි වර්ෂය :———.
සිංහල/දෙමළ සඳහා සාමාර්ථය :————.
ඉංග්‍රීසි භාෂාව සඳහා සාමාර්ථය :————.

15. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 09 ඡේදයට අනුව සුදුසුකම් ඃ

(i) ..................................................
(ii) ..................................................
(iii) ..................................................
(iv) ..................................................
(v) ..................................................
(vi) ..................................................

16. භාෂා ප්‍රවීණතාව ඃ (අදාළ තීරුවේ ( √ ) ලකුණ යොදන්න.)

| | ඉතා හොඳයි | හොඳයි | සාමාන්‍යයි | දුර්වලයි |
|---|---|---|---|---|
| සිංහල | | | | |
| දෙමළ | | | | |
| ඉංග්‍රීසි | | | | |

**අයදුම්කරුගේ සහතිකය**

.............................වන මම මෙහි සඳහන් කරන ලද සියලුම කරුණු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මම රජයේ සේවයෙන් පහකර හෝ සානුකම්පිත විකල්පයක් වශයෙන් අකාර්යක්ෂමතාවය මත සේවයෙන් විශ්‍රාම ගන්වා හෝ නොමැති බවත්, තනතුරු අතහැර ගිය අයකු සේ සලකා නැති බවත් සහතික කරමි. මෙහි අන්තර්ගත කරුණු කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව

මා තෝරාගැනීමට කලින් හෙළිවුවහොත් නුසුදුසු කිරීමට යටත්වන බවත්, තෝරාගැනීමෙන් අනතුරුව එවැනි තත්ත්වයක් අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා රැකියාවෙන් ඉවත් කළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

මෙම අයදුම් පත්‍රය ඉදිරිපත් කරන ......................... මයා/මිය/මෙනවිය මධ්‍යම රජය යටතේ වන ................. පළාත් සභාව යටතේ වන ............... අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ ............... වශයෙන් ස්ථිර/ තාවකාලික/ අනියම් නිලධාරියකු/නිලධාරිනියක වශයෙන් සේවය කරන බවත්, අදළ ගැසට් නිවේදනයෙහි සඳහන් රෙගුලාසි ප්‍රකාරව ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.

————,
අමාත්‍යාංශ ලේකම්ගේ/
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා
නිල මුද්‍රාව.

දිනය :————.
නම :————.
තනතුර :————.
අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව :————.

06-671

---

## ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ නීති නිලධාරි (III ශ්‍රේණිය) තනතුරේ පුරප්පාඩු පිරවීම

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ නීති නිලධාරි (III ශ්‍රේණිය) තනතුරේ පවතින පුරප්පාඩු එකක් (01) පිරවීම සඳහා විශිෂ්ඨ චරිතයකින් යුත් සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. තනතුරේ සාමාන්‍ය රාජකාරි විස්තරය :

දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරනු ලබන නඩු සම්බන්ධයෙන් සහ දෙපාර්තමේන්තු හා ඒ යටතේ පවතින ආයතන වල නිලධාරින් වග උත්තරකරුවන් වන නඩු සම්බන්ධයෙන් නීති උපදෙස් ලබා දීම, නීති දෙපාර්තමේන්තුව හා සම්බන්ධීකරණය කිරීම, නඩු කටයුතු සඳහා සහභාගී වීම, මානව හිමිකම් පැමිණිලි සඳහා සහභාගි වීම, දෙපාර්තමේන්තුවේ හා දෙපාර්තමේන්තු විෂය පථයට අයත් රාජ්‍ය ආයතනවල පනත් කෙටුම්පත්, රෙගුලාසි වැනි නීත්‍යානුකූල ලියවිලි සකස් කිරීම සහ එම ආයතනවල නීතිමය කටයුතු සඳහා උපදෙස් ලබා දීම වැනි කාර්යයන් පැවරෙන සේවා ගණයකි.

03. සේවා කොන්දේසි :

රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසි වලට ද, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ නීති නිලධාරී තනතුරේ බඳවා ගැනීම් පටිපාටියේ පනවා ඇති නියමයන් හා කොන්දේසි වලට ද එම බඳවා ගැනීම් පටිපාටියට කර ඇති හෝ මින් මතු කෙරෙන හෝ සංශෝධන වලටද, දෙපාර්තමේන්තුගත රෙගුලාසි වලට ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් රජයේ සේවය සම්බන්ධයෙන් පනවනු ලබන සියළු රීති, රෙගුලාසි, නියෝග හා කාර්ය පටිපාටි, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය, රජයේ මුදල් රෙගුලාසි, රජයේ වෙනත් රෙගුලාසි, චක්‍රලේඛ හා උපදෙස්වලට ද ඒවාට අදළව වරින් වර නිකුත් කරන ලද සංශෝධන වලට ද යටත්ව තෝරාගනු ලැබූ අපේක්ෂකයන් නීති නිලධාරී තනතුරට පත් කරනු ලැබේ.

3.1 මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය. තෝරාගනු ලබන අයදුම්කරුවන් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දයක මුදල් ගෙවිය යුතු ය.

3.2 මෙම පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලැබේ. තනතුරට බඳවාගෙන වසර තුනක් ඇතුළත පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් ද II වන ශ්‍රේණියට උසස් වී වසර තුනක් ගත වීමට පෙර දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් ද I වන ශ්‍රේණියට උසස් වී වසර පහක් ගත වීමට පෙර තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් ද සමත් විය යුතු ය.

3.3 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014ට අනුව හා ඊට ආනුශාංගික චක්‍රලේඛවලට අනුව තනතුරට බැඳී වසර පහක් ඇතුළත නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීනතාවය ලබා ගත යුතු ය. රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් නියමිත භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළ ලබා ගත යුතු ය.

04. වයස් සීමාව :

අයදුම්පත් කැඳවනු ලබන අවසාන දිනට අවුරුදු 21ට නොඅඩු වූ ද 45ට නොවැඩි වූ ද අය විය යුතු ය.

05. මාසික වැටුප් පරිමාණය :

මෙම තනතුරට රා.පරි.ච.6/2006 අනුව SL 1 - 2006 වැටුප් බාණ්ඩය අදළ වේ. එම වැටුප් බාණ්ඩයට හිමි වැටුප් පරිමාණය පහත සඳහන් පරිදි වේ.

රු.22,935 - 10 x 645 - 8 x 790 - 17 x 1,050 -රු. 53,555/-

06. අධ්‍යාපන සුදුසුකම් :

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් නීතිය පිළිබඳ උපාධියක් ලබා තිබීම හෝ ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතීඥයකු වශයෙන් දිවුරුම් දී තිබීම සහ ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතීඥයකු වශයෙන් දිවුරුම් දීමෙන් පසුව වසර තුන (03)කට නොඅඩු සක්‍රීය වෘත්තීය පළපුරුද්දක් ලබාතිබිය යුතු ය. මීට අමතරව අ.පො.ස. (සා/පෙළ) විභාගයේදී හෝ අ.පො.ස. (උ/පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාවට අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් ලබා තිබිය යුතු ය.

07. සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :

ඉහත 05 ඡේදය යටතේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය පරිදි පත් කෙරෙන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහලම ලකුණු

ලබා ගන්නා අපේක්ෂකයා පුරප්පාඩුව සඳහා බඳවාගනු ලැබේ. එහි දී රාජ්‍ය සේවා කොමිෂන් සභාව අනුමත කරන ලද පහත සඳහන් ලකුණු දීමේ පටිපාටියට අනුකූලව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

| *පරීක්ෂාකර ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
| --- | --- |
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 |
| අතිරේක වෘත්තීය සුදුසුකම් | 15 |
| අතිරේක පළපුරුද්ද වෘත්තීය සුදුසුකම් යටතේ නීතීඥවරයෙකු ලෙස අවශ්‍ය වන අවම අවුරුදු 03ක සේවා කාලයට අමතරව (එක් වසරකට ලකුණු 05 කි) | 30 |
| පරිගණක හැකියාව, තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම | 15 |
| ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව | 15 |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාව | 05 |

08. ඉල්ලුම් කළයුතු පිළිවෙල :

සියලු විස්තර ඇතුළත් කරමින් ඔබ විසින් සකස් කරන ලද අයදුම්පත්‍රය උප්පැන්න සහතිකයේ පිටපතක්, ජාතික හැඳුනුම්පතේ පිටපතක්, අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් සහ සේවා පළපුරුද්ද සනාථ කෙරෙන සහතිකවල පිටපත් සමග 2016 ජූලි 12 දින හෝ ඊට පෙර ලැබෙන සේ, දුම්රිය සාමාන්‍යාධිකාරී, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව, තැ.පෙ.355, ඕල්කට් මාවත, කොළඹ 10 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. මෙදිනට පසුව ලැබෙන කිසිදු අයදුම්පත්‍රයක් භාරගනු නොලැබේ. ඉල්ලුම් පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙලවරේ ''ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ නීති නිළධාරි තනතුරට බඳවා ගැනීම'' යනුවෙන් පැහැදිලිව සඳහන් කර එවිය යුතු ය.

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අපේක්ෂකයින්ගේ අයදුම්පත් ස්වකීය ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

නිහාල් සෝමවීර,
ලේකම්,
ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය.

2016 මැයි මස 16 වැනි දින,
ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය,
07 වැනි මහල,
සෙත්සිරිපාය,
අදියර II,
බත්තරමුල්ල.

06-501

---

## විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

**ජාතික වෘත්තීය පුහුණු ආයතනය - නාරාහේන්පිට**

***2016 වසරේ දෙවන අර්ධ වර්ෂය සඳහා ආධුනිකයින් බඳවා ගැනීම***

පූර්ණ කාලීන පාඨමාලා සඳහා 2016.06.30 දිනට වයස අවු. 16ත් 35ත් අතර ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම අයදුම් කළ හැක. අර්ධ කාලීන පාඨමාලා සඳහා උපරිම වයස් සීමාවන් නොසැලකෙන අතර එම පාඨමාලා සෙනසුරාද/ඉරිදා දිනයන්හි හා සන්ධ්‍යා කාලීනව ද පැවැත්වේ.

ප්‍රතිලාභ

* දේශීය විදේශීය රැකියා අවස්ථා
* කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආරම්භ කිරීමට අඩු පොළී ණය පහසුකම්
* ජාතික හා ජාත්‍යන්තර පිළිගත් NVQ සහතිකයක්
* විෂය දැනුමට අමතරව ඉංග්‍රීසි දැනුම
* දීමනා සමග මාස 06ක වැඩිදුර පුහුණුව

සුදුසුකම් :

A. අ.පො.ස.(සා.පෙළ) විෂයයන් 06කින් සමත් වීම.

B. 9 වසර සමත් වීම.

C. ජාතික වෘත්තීය සුදුසුකම් යන්ත්‍ර ශිල්පී Q2 L3 සහතික ලබා තිබීම.

D. අ.පො.ස.(සා.පෙළ) ඉංග්‍රීසි සම්මාන සහිතව විෂයයන් 06කින් සමත් වීම.

E. පිළිගත් කාර්මික ආයතනයකින් මූලික පාඨමාලාවක් හදාරා ක්ෂේත්‍රයේ රැකියාවක නියුතු අය හෝ පිළිගත් ආයතනයක කාර්මික ක්ෂේත්‍රයේ වැඩ මූලික/වැඩ මූලික සහායක/වැඩ අධීක්ෂක රැකියාවක අවුරුදු 02 ක පළපුරුද්දක් තිබීම.

F. 9 වසර සමත්වීම හා අවුරුදු 21 ට වැඩිවීම හා සැහැල්ලු වාහන රියැදුරු බලපත්‍රය ලබා වසර 3ක් ගතවී තිබීම.

G. 9 වසර සමත්වීම සහ අවුරුදු 18 ට වැඩිවීම.

H. අ.පො.ස. (සා. පෙළ) ගණිතය, විද්‍යාව ඇතුළුව විෂයයන් 06කින් සමත් වීම සහ මූලික පරිගණක පාඨමාලාවක් හදාරා තිබීම.

I. අ.පො.ස. (සා.පෙළ) පෙනී සිටීම.

J. CCNA පාඨමාලාවක් හදාරා සිටීම.

K. අ.පො.ස. (සා.පෙළ) ඉංග්‍රීසි සහිතව විෂයයන් 06කින් සමත් වී තිබීම.

L. මූලික සැලසුම් ශිල්පී පාඨමාලාවක් හදාරා තිබීම හෝ අදාල ක්ෂේත්‍රයේ නියැලී සිටීම.

M. ඡායාරූප ශිල්පය පිළිබඳ පළපුරුද්දක් ලබා තිබීම.

N. අ.පො.ස. (සා/පෙළ) ඉංග්‍රීසි, ගණිතය සම්මාන සහිතව විෂයයන් 6කින් සමත් වීම.

O. රූපලාවන්‍ය හෝ කොණ්ඩා සැකසුම් ශිල්පී NVQ Level 3/4 ලබා තිබීම.

P. අ.පො.ස. (උ/පෙළ) සමත් වීම හෝ Tailor/Pattern Maker NVQ Level 4 ලබා තිබීම.

*පූර්ණ කාලීන පාඨමාලා*

| *No.* | *Course* | *NVQ Level* | *Duration (Months)* | *Qualifications* | *Course Fees (Rs.)* |
|---|---|---|---|---|---|
| 1 | Computer Hardware Technician A+ (CISCO IT Essential) | IV | 6 | D | 12,000.00 |
| 2 | Computer Graphic Designer | IV | 6 | A | 12,500.00 |
| 3 | Adobe ACA - Graphic Designer | IV | 6 | D | 15,000.00 |
| 4 | NVQ - IV in ICT (ICT Technician) | IV | 6 | N | 7,500.00 |
| 5 | Computer Graphic Designer (ශ්‍රවණාබාධිත) | IV | 6 | _ | Free |
| 6 | Baker | IV | 6 | A | 30,000.00 |
| 7 | Cook | IV | 6 | A | 30,000.00 |
| 8 | Waiter/Steward | IV | 6 | I | 4,500.00 |
| 9 | Automobile A/C Mechanic | IV | 6 | A | 2,700.00 |
| 10 | Beautician | IV | 6 | B | 20,000.00 |
| 11 | Hairdresser | IV | 6 | B | 30,000.00 |
| 12 | Diploma in Industrial Management | Non | 6 | E | 25,000.00 |
| 13 | Offset Lithographic Operator | IV | 6 | I | 5,500.00 |
| 14 | Machinist (CNC Milling) | IV | 6 | C | 6,000.00 |
| 15 | Driver - Light Vehicle | Non | 3 | G | 10,500.00 |
| 16 | Automobile Painter | III | 6 | B | 2,000.00 |
| 17 | Cosmatelogy | V | 12 | O | 60,000.00 |
| 18 | Fashion Designer | V | 24 | P | 50,000.00 |

*අර්ධ කාලීන පාඨමාලා*

| Course | Duration (Hours) | Qualifications (Rs.) | Course Fee |
|---|---|---|---|
| Computer Hardware Technician A+ (CISCO IT Essential) | 120 | A | 12,000.00 |
| CCNA Academy Programme | 300 | D | 40,000.00 |
| PC Based Application (MS Office) | 100 | I | 9,500.00 |
| Computer Graphic Designer (NVQ IV) | 392 | H | 22,500.00 |
| ICT Technician (NVQ IV) | 350 | A | 20,000.00 |
| IC3 + International Certificate | 120 | K | 10,000.00 |
| CCN Security | 150 | J | 20,000.00 |
| Photographer | 150 | M | 40,000.00 |
| Auto Cad ( 2D) | 80 | L | 7,500.00 |
| Auto Cad ( 3D) | 80 | L | 8,000.00 |
| Baker | 100 | B | 14,000.00 |
| Cut & Style hair (Ladies) | 100 | B | 10,250.00 |
| Facials & skin care Treatment | 100 | B | 10,500.00 |
| Make up & Bridle Dressing | 80 | B | 11,000.00 |
| Auto Mobile Technician (Engine/ Petrol/ Diesel) | 160 | B | 10,500.00 |
| Draughtsmanship (Building Drawing) | 150 | D | 13,500.00 |
| CNC Programming | 125 | A | 9,000.00 |
| Electrical Wiring Industrial | 120 | A | 14,500.00 |
| Electrical Wiring Domestic | 120 | A | 13,000.00 |
| Motor Control System | 100 | A | 13,000.00 |
| Automobile A/C Mechanic | 125 | B | 13,000.00 |
| Driver (Light Vehicle) | 105 | G | 13,500.00 |
| English Language | 100 | B | 10,500.00 |

තමන් විසින් සකස් කරන ලද අයදුම්පත් 2016.06.25 දිනට පෙර පහත ලිපිනයට එවන්න.

නියෝජ්‍ය අධ්‍යක්ෂ,
ජාතික වෘත්තීය පුහුණු ආයතනය,
354, ඇල්විටිගල මාවත,
නාරාහේන්පිට.

දුරකථනය : 011-2592233
011-7277111 (IT Centre)
ඊ-මේල් : nvtinarahenpita @vtasl.gov.lk :
ෆැක්ස් අංක : 0112-553856,
011-2592233

06-523

---

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය

**ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ III ශ්‍රේණියේ පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2015**

ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ III ශ්‍රේණියට අයත් පහත සඳහන් පුරප්පාඩු සඳහා සුදුස්සන් තෝරා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. කවරයේ වම්පස උඩ කෙළවරේ ''ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ III ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා වන විවෘත තරග විභාගය''

යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතු ය. තව ද විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන්ද, දෙමළ ඉල්ලුම් පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතු ය.

| *අනු. අංකය* | *පුරප්පාඩු තනතුර අයත් දෙපාර්තමේන්තුව/අමාත්‍යාංශය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *සංකේත අංකය* |
|---|---|---|---|---|
| 1. | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | සහකාර අධ්‍යක්ෂ (පර්යේෂණ) | 14 | 101 |
| | | සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන) | 09 | 102 |
| 2. | කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව | කාලගුණ විද්‍යාඥ | 01 | 201 |
| 3. | විද්‍යා, තාක්‍ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය | සහකාර අධ්‍යක්‍ෂ (පර්යේෂණ) | 01 | 301 |
| 4. | ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව | සහකාර අධ්‍යක්ෂ | 11 | 401 |
| 5. | සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව | භෞතික විද්‍යාඥ | 15 | 501 |

(*අ*) අයදුම්පත් කැඳවන අවසාන දිනය 2016.07.15 දින වේ.

***සටහන.***-ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳදරාගත යුතු ය.

* කිසියම් අයදුම්කරුවකු ඉහත සඳහන් එක් තනතුරකට වඩා අයදුම් කරන අවස්ථාවකදී එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් නොකළ යුතු අතර, ඒ ඒ තනතුර සඳහා වූ මනාප අනුපිළිවෙල මෙම නිවේදනයේ දක්වා ඇති පරිදි එකම අයදුම්පත්‍රයක සටහන් කළ යුතු ය. එක් අපේක්ෂකයකුට අයදුම් කළ හැකි උපරිම තනතුරු සංඛ්‍යාව 5ක් වන අතර, එම සංඛ්‍යාවට වැඩි වශයෙන් අයදුම් කර ඇති තනතුරු සලකා බලනු නොලැබේ. එසේම අයදුම් කරනු ලැබූ තනතුරු මනාප අනුපිළිවෙල පසුව වෙනස් කිරීමේ හැකියාවක් නොමැත.

***නිදර්ශනය*** :

පළමු මනාපය ලෙස විද්‍යා, තාක්‍ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂ (පර්යේෂණ) තනතුර ද, දෙවන මනාපය ලෙස අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ (පර්යේෂණ) තනතුර ද, තුන්වන මනාපය ලෙස කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ කාලගුණ විද්‍යාඥ තනතුර යන තනතුරුවලට අයදුම් කිරීමට අපේක්ෂා කරන අයදුම්කරුවෙකු, එම තනතුරු වලට අදාළ සංකේත අංක අයදුම්පත්‍රයේ 02. වගුවේ ''සංකේත අංකය'' යන තීරුවේ පහත පරිදි දැක්විය යුතු ය.

| අනු. අංකය | මනාප ප්‍රමුඛතාවය | දෙපාර්තමේන්තුව | තනතුර | සංකේත අංකය | | |
|---|---|---|---|---|---|---|
| 1. | 1 වන මනාපය | විද්‍යා, තාක්‍ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය | සහකාර අධ්‍යක්‍ෂ (පර්යේෂණ) | 3 | 0 | 1 |
| 2. | 2 වන මනාපය | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | සහකාර අධ්‍යක්‍ෂ (පර්යේෂණ) | 1 | 0 | 1 |
| 3. | 3 වන මනාපය | කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව | කාලගුණ විද්‍යාඥ | 2 | 0 | 1 |
| 4. | 4 වන මනාපය | | | | | |
| 5. | 5 වන මනාපය | | | | | |

1. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය* :

ලිඛිත විභාගයක ප්‍රතිඵල මත බඳවා ගනු ලබන අතර සුදුසුකම් පරීක්ෂාව සඳහා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලැබේ. අයදුම්කරුවන්ගේ විභාග ලකුණුවල කුසලතා අනුපිළිවෙල සහ අයදුම්පත්‍රයේ සඳහන් තනතුරු මනාප ප්‍රමුඛතාවය සැලකිල්ලට ගනිමින් පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගනු ලැබේ.

පත්කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මකවන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග අනුව තීරණය කරනු ලැබේ.

2. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* :

(i) මෙම තනතුර ස්ථිරය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතු ය.

(ii) මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත් වන අතර එම වසර තුන (03) ඇතුළත පළමුවැනි කාර්යක්‍ෂමතා කඩඉම් පරීක්‍ෂණය සමත් විය යුතු ය.

(iii) 2014.01.21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හි විධිවිධානවලට හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීනතා මට්ටම වසර 05ක් තුළ දී ලබා ගත යුතු ය. රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් පරිවාස කාලය තුලදී එක් රාජ්‍ය භාෂාවක් පිළිබඳව ප්‍රවීනතාවය ලබා ගත යුතු අතර, අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීනතාවය වසර පහක් (05) ක් තුළ ලබාගත යුතු ය.

(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවලට ද, අංක 1877/27 දරන 2014 අගෝස්තු මස 28 දිනැති *ගැසට් පත්‍රය* මගින් ප්‍රසිද්ධ කරන ලද ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ සේවා ව්‍යවස්ථාවේ සඳහන් කොන්දේසිවලට ද, මෙම පත්වීම යටත් වේ.

3. *වැටුප් පරිමාණය* :

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 දරන වැටුප් චක්‍රලේඛයට අනුව SL-1-2006, රු. 47,615-10 x 1,335 - 8 x 1,630 - 17 x 2,170 - රු. 110,895 ක (මාසික) වැටුප් පරිමාණයක් හිමි වේ.

4. *අධ්‍යාපන සුදුසුකම්* :

| අනු අංකය | දෙපාර්තමේන්තුව | වෘත්තිය | අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් |
|---|---|---|---|
| (1) | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | (1) සහකාර අධ්‍යක්‍ෂ (පර්යේෂණ) | (*අ*) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින්, කෘෂිකර්මය හෝ උද්භිද විද්‍යාව හෝ රසායන විද්‍යා හෝ ජීව විද්‍යාව හෝ ජෛවමිතිය යන විෂයයන්ගෙන් එක් විෂයයකින් විශේෂ උපාධියක් පන්ති සාමාර්ථයක් සහිතව ලබා තිබීම ;<br>හෝ |
| | | | (*ආ*) කෘෂිකර්මය හෝ උද්භිද විද්‍යාව හෝ රසායන විද්‍යාව හෝ ජීව විද්‍යාව හෝ ජෛවමිතිය යන විෂයයන්ගෙන් එක් විෂයයක් සහිතව සාමාන්‍ය උපාධියක් පන්ති සාමාර්ථයක් සහිතව ලබා තිබීම ;<br>හෝ |
| | | | (*ඇ*) විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් සමග කෘෂිකර්මය හෝ උද්භිද විද්‍යාව හෝ රසායන විද්‍යාව හෝ ජීව විද්‍යාව හෝ ජෛවමිතිය |

| අනු. අංකය | දෙපාර්තමේන්තුව | වෘත්තිය | අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් |
|---|---|---|---|
| | | | යන විෂයයන්ගෙන් එක් විෂයයකට අදළ පශ්චාත් උපාධියක් ලබා තිබීම. |
| | | (ii) සහකාර අධ්‍යක්‍ෂ (සංවර්ධන) | (අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදනය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් කෘෂිකර්මය හෝ උද්භිද විද්‍යාව හෝ රසායන විද්‍යා හෝ ජීව විද්‍යාව හෝ ජෛවමිතිය යන විෂයයන්ගෙන් එක් විෂයයකින් විශේෂ උපාධියක් පන්ති සාමාර්ථයක් සහිතව ලබා තිබීම.<br>හෝ |
| | | | (ආ) කෘෂිකර්මය හෝ උද්භිද විද්‍යාව හෝ රසායන විද්‍යාව හෝ ජීව විද්‍යාව හෝ ජෛවමිතිය යන විෂයයන්නෙ එක් විෂයයක් සහිතව සාමාන්‍ය උපාධියක් පන්ති සාමාර්ථයක් සහිතව ලබා තිබීම.<br>හෝ |
| | | | (ඇ) විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් සමඟ කෘෂිකර්මය හෝ උද්භිද විද්‍යාව හෝ රසායන විද්‍යාව හෝ ජීව විද්‍යාව හෝ ජෛවමිතිය යන විෂයයන්ගෙන් එක් විෂයයකට අදළ පශ්චාත් උපාධියක් ලබා තිබීම. |
| 2. | කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව | 1. කාලගුණ විද්‍යාඥ | (අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් භෞතික විද්‍යාව හෝ ගණිතය පිළිබඳව පන්ති සාමාර්ථයක් සහිත විද්‍යාවේදී විශේෂ උපාධියක් ලබා තිබීම.<br>හෝ |
| | | | (ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් භෞතික විද්‍යාව සහ ගණිතය විෂයයන් සහිතව යටත් පිරිසෙයින් දෙවැනි පන්තියේ (ඉහළ) සාමාර්ථයක් සහිතව විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම.<br>හෝ |
| | | | (ඇ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් භෞතික විද්‍යාව සහ/හෝ ගණිතය විෂයයන් සහිතව යටත් පිරිසෙයින් දෙවැනි පන්තියේ (පහළ) සාමාර්ථයක් සහිතව විද්‍යාවේදී උපාධියක් සහ පිළිගත් විශ්ව විද්‍යාලයකින් කාලගුණ විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම. |
| | | | *සටහන* :<br>ඉහත සඳහන් විශේෂ උපාධිය ගණිතය විෂයය පිළිබඳව නම් භෞතික විද්‍යාව විෂයයෙන් සාමාන්‍ය යෝග්‍යතා පරීක්‍ෂණය හෝ ඊට ඉහළ මට්ටමක පරීක්‍ෂණයකින් සමත් වී තිබිය යුතු ය. |
| 3. | විද්‍යා, තාක්‍ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය | 1. සහකාර අධ්‍යක්‍ෂ (පර්යේෂණ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රධානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින්, |

| අනු. අංකය | දෙපාර්තමේන්තුව | වෘත්තිය | අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් |
|---|---|---|---|
| | | | (අ) රසායන විද්‍යාව හෝ භෞතික විද්‍යාව යන විෂයයන් සහිතව පන්ති සාමාර්ථයක් සහිතව විද්‍යාවේදී විශේෂ උපාධියක් ලබා තිබීම; හෝ |
| | | | (ආ) රසායන විද්‍යාව හෝ භෞතික විද්‍යාව යන විෂයයන් සහිතව පන්ති සාමාර්ථයක් සහිතව විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් ලබා තිබීම; හෝ |
| | | | (ඇ) රසායන විද්‍යාව හෝ භෞතික විද්‍යාව යන විෂයයන් සහිතව විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් සමඟ එම විෂයයකින් පශ්චාත් උපාධියක් ලබා තිබීම. |
| 4. | ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව | 1. සහකාර අධ්‍යක්ෂ | (අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් සිවු අවුරුදු උද්භිද විද්‍යාව පිළිබඳ හෝ කෘෂිකර්ම විද්‍යාව පිළිබඳ විශේෂවේදී පළමු පන්තියේ හෝ දෙවන පන්තියේ සාමාර්ථයක් සහිතව උපාධියක් ලබා තිබීම; හෝ |
| | | | (ආ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් උද්භිද විද්‍යාව පිළිබඳ හෝ කෘෂිකර්ම විද්‍යාව පිළිබඳ විශේෂවේදී සාමාන්‍ය සාමාර්ථයක් සහිත උපාධියක් සමඟ පිළිගත් විශ්ව විද්‍යාලයකින් පරිසර විද්‍යාව, වන විද්‍යාව, පැළෑටි වර්ගීකරණය, ජෛව විවිධත්වය හා සංරක්ෂණය හෝ උද්‍යාන විද්‍යා හෝ භූමි අලංකරණය පිළිබඳ නිබන්ධනයක් සහිතව අවම වශයෙන් දෑ අවුරුදු පශ්චාත් උපාධියක් ලබා තිබීම; හෝ |
| | | | (ඇ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් සාමාන්‍ය ජීව විද්‍යා හෝ කෘෂිකර්ම විද්‍යා උපාධියක් සමඟ පිළිගත් විශ්ව විද්‍යාලයකින් පරිසර විද්‍යාව, වන විද්‍යාව, පැළෑටි වර්ගීකරණය, ජෛව විවිධත්වය හා සංරක්ෂණය හෝ උද්‍යාන විද්‍යා හෝ භූමි අලංකරණය පිළිබඳ නිබන්ධනයක් සහිතව අවම වශයෙන් දෑ අවුරුදු පශ්චාත් උපාධියක් ලබා තිබීම. |
| 5. | සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව | 1. භෞතික විද්‍යාඥ | (අ) පිළිගත් විශ්ව විද්‍යාලයකින් භෞතික විද්‍යා විෂයෙහි (විශේෂ) ගෞරව උපාධියක් ලබා තිබීම; හෝ |
| | | | (ආ) භෞතික විද්‍යා විශේෂ උපාධිය හෝ භෞතික විද්‍යාව විෂයයක් ලෙස විද්‍යාවේදී උපාධිය සහ විකිරණ ශිල්පියකු වශයෙන් පිළිගත් ආයතනයක පස් වසරක සේවයක් ඇති නිලධාරියකු වීම. |

5. *වයස් සීමාව :*
අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 22ට නොඅඩු විය යුතු අතර අවුරුදු 32ට නොවැඩි විය යුතුය.

6. *කායික සුදුසුකම් :*
සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

7. *වෙනත් සුදුසුකම් :*
(i) අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.
(ii) අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
(iii) යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන අයකු නොවිය යුතුය.
(iv) ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ විවෘත තරඟ විභාගයකට දෙවතාවකට වඩා පෙනී නොසිටි අයදුම්කරුවකු විය යුතුය.
(v) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් *ගැසට්* නිවේදනයේ සඳහන් අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

8.
8.1 *ලිඛිත විභාගය :*
8.1.1 මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලැබේ.

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40 |
| 2. පොදු ප්‍රශ්න පත්‍රය | පැය 03 | 100 | 40 |

8.1.2 විෂය නිර්දේශය :

| | *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|---|
| 01. | බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයාගේ තර්කණ ශක්තිය, සාමාන්‍ය බුද්ධිය සහ තීරණ ගැනීමේ හැකියාව වැනි කරුණු නිශ්චය කිරීම සඳහා සකස් කරනු ලබන මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්න 50කින් සමන්විත වනු ඇත. |
| 02. | පොදු ප්‍රශ්න පත්‍රය | ශ්‍රී ලංකාවේ දේශපාලන, සමාජමය, සංස්කෘතික හා ආර්ථික පරිසරය ද, ජාතික හා අන්තර්ජාතික වශයෙන් වැදගත් වන නූතන කරුණු ද, ජාතික හා ජාත්‍යාන්තර විද්‍යාත්මක හා කාර්මික සංවර්ධනය ද සම්බන්ධයෙන් ඇති දැනුම පරීක්ෂා කිරීම සඳහා සකස් වූ සාමාන්‍ය දැනුම මැනෙන ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකි. පළමු කොටස කෙටි ප්‍රශ්න වලින් සමන්විතය. ලකුණු 25කි. දෙවන කොටස අර්ධ ව්‍යුහගත ප්‍රශ්න වලින් සමන්විතය. ප්‍රශ්න 8කින් 5කට පිළිතුරු සැපයිය යුතුය. ලකුණු 75 කි. |

8.2 *බඳවා ගැනීමේ ක්‍රමය :*

එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා 40% හෝ ඊට වඩා ලකුණු ලබා ගන්නා අපේක්ෂකයන්ගේ ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ. එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා 40% හෝ ඊට වඩා ලකුණු ලබාගන්නා අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර, අයදුම්කරුවන්ගේ සුදුසුකම් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පරීක්ෂා කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.

9. *විභාග කොන්දේසි :*

(i) විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා මාධ්‍ය වලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයන් කැමති එක් භාෂාවකින් විභාග යට පෙනී සිටිය හැක. අපේක්ෂකයන් මෙම විභාගයේ සියලුම ප්‍රශ්නපත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු දිය යුතුය. අපේක්ෂකයකුට ස්වකීය අයදුම්පත්‍රයෙහි දක්වෙන විභාග මාධ්‍ය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ. සෑම අපේක්ෂකයකුම ප්‍රශ්න පත්‍ර සියල්ලටම පෙනී සිටිය යුතුය.

(ii) විභාග ගාස්තුව රු. 1,000 කි. එම විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකට ගෙවා අයදුම්කරුගේ නමින්ම ලබාගන්නා ලදුපතෙහි දරයක් ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැළවෙන සේ අලවන්න. එම කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(iii) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවනු නොලැබේ.
(iv) මෙම විභාගය ඔක්තෝබර් මස පැවැත්වේ. විභාගය පවත්වනු ලබන දිනය පසුව දැනුම් දෙනු ලැබේ.
(v) අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

*සටහන :* ප්‍රවේශ පත්‍රය නොමැතිව විභාග ශාලාවට ඇතුළු වීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළයුතු වන්නේ තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රයක් පමණි.

අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකමක් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකිය යුතුය.

(vi) ඉල්ලුම්පත්‍රය සෙ. මී. 21-29.7 ප්‍රමාණයේ A4 කඩදාසිවල සකස් කළ යුතු අතර, ශීර්ෂ අංක 1.0 සිට 3.8 තෙක් ශීර්ෂ පළමුවන පිටුවට ද, 3.8 සිට ඉදිරියට ඇති ශීර්ෂ පිළිවෙලින් අනෙක් පිටුවලට ද වන ලෙස ගෙන සකස් කළයුතු බවත්, ඊට අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිළිව ඇතුලත් කළ යුතුය. ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම් පත්‍ර හා අසම්පූර්ණ ඉල්ලුම් පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදාල ඉල්ලුම් පත්‍රයේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තව ද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම් පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල ද යන්න අයදුම්කරු විසින් විමසා බැලිය යුතු බවත්, එසේ නොවුන හොත් අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප වන බවත් වැඩිදුරටත් දන්වමි. ඉල්ලුම් පත්‍ර මේ සමඟ ඇති ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුව සකසන්න.

*සටහන.-* ඔබගේ පහසුව සඳහා නිවැරදිව සකස් කරන ලද විභාග අයදුම් පත්‍රය රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියෙන් ( w.w.w.pubad.gov.lk) බාගත කළ හැක.

(vii) ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දන්වනු නොලබන අතර, විභාගය සඳහා අයදුම්කරුවන්ට ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම පුවත්පත්වල නිවේදනයක් පළකරනු ලැබේ. නිවේදනය පළ වී දින 2 හෝ 3ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ද ලියාපදිංචි කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද ළඟ තබාගෙන, නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

(viii) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත විභාගය කල් දැමීමේ හෝ අවලංගු කිරීමේ බලය විභාග කොමසාරිස් ජනරාල්වරයා සතුවේ.

(ix) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීති වලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංගනය කළ හොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

(x) *අපේක්ෂකයාගේ අනන්‍යතාවය.*-විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් සෑම අපේක්ෂකයකුම විභාග ශාලාවේදී තම අනන්‍යතාවය ඔප්පු කර තිබිය යුතුය. පහත සඳහන් ලේඛනවලින් එකක් පමණක් පිළිගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත,
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය,
(iii) වලංගු රියදුරු බලපත්‍රය.

***සැලකිය යුතුය :*** *(අ)* අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ පිටපතක් නොඇමිණිය යුතුය.
*(ආ)* ඉල්ලූ අවස්ථාවක දී ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන්ගේ අයදුම්පත්‍ර ගැන සලකා බලනු නොලැබේ.

රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ, රාජ්‍ය සංස්ථාවල සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තමන්ගේ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් අයදුම්පත් එවිය යුතුය. විභාගයට පෙනී සිටීමට පෙර සෑම අයදුම්කරුවෙකුම තම අත්සන සහතික කරවා ගැනීම අනිවාර්ය වේ. ආයතනයකින් විභාගයට පෙනී සිටින අයදුම්කරුවෙකු ඔහුගේ අත්සන

තමා සේවය කරන ආයතනයේ ප්‍රධානියා ලවා ද සහතික කරවා ගත යුතුය. එසේ නොවන අයදුම්කරුවන් තම අත්සන රජයේ පාසල් ප්‍රධානියෙකු/විශ්‍රාමික ප්‍රධානියෙකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරීලත් නිලධාරියෙකු, රු. 2,40,360 ක් හෝ ඊට ඉහළ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් පාලන සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන්වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයෙක් හෝ ලවා සහතික කරවා ගත යුතුය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි,

ජේ. දඩල්ලගේ,
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය.

ආදර්ශ අයදුම්පත්‍රය

ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ III ශ්‍රේණියට බඳවාගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2015
Open Competitive Examination for Recruitment to Class III of Sri Lanka Scientific Service - 2015

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

1.0 මාධ්‍යය :- විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :

සිංහල - 2 දෙමළ - 3 ඉංග්‍රීසි - 4 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

* ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කළ යුත්තේ විභාගයට ඉදිරිපත්වන භාෂා මාධ්‍යයෙනි.

2.0 අයදුම්කරන තනතුර/තනතුරු :

| *අනු අංකය* | *මනාප ප්‍රමුඛතාවය* | *දෙපාර්තමේන්තුව* | *තනතුර* | *සංකේත අංකය* | | |
|---|---|---|---|---|---|---|
| 1. | 1 වන මනාපය | | | | | |
| 2. | 2 වන මනාපය | | | | | |
| 3. | 3 වන මනාපය | | | | | |
| 4. | 4 වන මනාපය | | | | | |
| 5. | 5 වන මනාපය | | | | | |

3.0 පුද්ගලික තොරතුරු :

3.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

3.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : GUNAWARDHANA, H. M. S. K.)

3.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

3.4 ස්ථිර ලිපිනය ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් :————.
(මෙම ලිපිනයට විභාග ප්‍රවේශ පත්‍ර තැපැල් කරනු ලැබේ.)

3.5 තැපැල් නගරය :————.

3.6 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.

3.7 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

3.8 ස්ත්‍රී/පුරුෂ භාවය : පුරුෂ - 0 ස්ත්‍රී - 1 ☐ (අදාළ අංකය කොටුව තුළ ලියන්න).

3.9 උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

3.10 ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස : අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

3.11 ජන වර්ගය : සිංහල - 1 දෙමළ - 2 ඉ. දෙමළ - 3 මුස්ලිම් - 4 වෙනත් - 5 ☐
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

3.12 විවාහක/අවිවාහක බව :- විවාහක - 1 අවිවාහක - 2 ☐ (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

3.13 දුරකථන අංකය : ජංගම ☐☐☐☐☐☐☐☐☐☐

නිවස ☐☐☐☐☐☐☐☐☐☐

3.14 විද්‍යුත් තැපැල් ලිපිනය :————.

4.0 සුදුසුකම් :-

4.1 උපාධිය ලද දිනය :————.
(මෙම සුදුසුකම් ඇතිදැයි බැලීමට නිවේදනයේ ii (iv) කරුණාකර හොඳින් කියවා බලන්න.)

| *විභාගය/උපාධිය* | *පන්තිය* | *වර්ෂය* | *විෂයයන්* | *විශ්ව විද්‍යාලය/ආයතනය* |
|---|---|---|---|---|
| | | | | |

5.0 මුදල් කුවිතාන්සිය මනා ලෙස අලවන්න :-

*ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.*

කුවිතාන්සි අංකය :————.

ගෙවන ලද තැපැල් කාර්යාලය :————.

දිනය :————.

6.0 යම්කිසි සාපරාධී වරදකට කෙදිනක හෝ උසාවියකදී වරදකරු වී ඇත්නම්, එම වරද හා ලැබූ දඬුවම පිළිබඳ විස්තර සඳහන් කරන්න. :————.

7.0 අයදුම්කරුගේ සහතිකය ඃ

මෙහි සඳහන් කර ඇති තොරතුරු මගේ දැනීමේ හා විශ්වාසය පරිදි, සත්‍ය බවත්, විභාග ගාස්තු ගෙවන ලද අංක .............. හා .............. වැනි දින දරන මුදල් කුවිතාන්සිය මීට අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. තවද විභාග නීතිරීති වලට අනුව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ කොන්දේසි අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන්පසුව හෝ මගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන යම් තීරණයකට මම එකඟ වෙමි. තවද මා මෙම තනතුරට පත්කර ගැනීමෙන් පසුව වුවද මෙහි ඇතුලත් යම්කිසි විස්තරයක් වැරදි බව හෝ අසත්‍ය බව දැනගැනීමට ලැබුණහොත් කිසිම වන්දි මුදලක් නොගෙවා මා සේවයෙන් පහකරනු ලැබීමට ද යටත් වන බවත්, එසේම විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

————,
අයැදුම්කරුගේ අත්සන.

දිනය :————.

8.0 *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම (ගැසට් නිවේදනයේ 13 (ඇ) පරිදි විය යුතුය) ඃ-*

මෙම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන ........................ (සම්පූර්ණ නම) යන අය මා පෞද්ගලිකව හඳුනන බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත්, ........................ දින ඔහුගේ/ඇයගේ අත්සන මා ඉදිරියේ දී තැබූ බවත් මම සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය :————.
අත්සන සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.

(නිල මුද්‍රාවකින් සනාථ කළ යුතුය)

9.0 ආයතන ප්‍රධානියාගේ සහතිකය ඃ

(රාජ්‍ය/පළාත් රාජ්‍ය/රාජ්‍ය සංස්ථා සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි.)

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ......................................... මහතා/මහත්මිය/මෙනවිය මෙම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ ............................. ලෙස සේවය කරන අතර, ඔහුගේ අයදුම්පත්‍රය නිර්දේශ කර ඉදිරිපත් කරමි. මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :————.
තනතුර :————.
දිනය :————.

(නිල මුද්‍රාව)

06-585

## අධ්‍යාපන අමාත්‍යාංශය

### සාමාන්‍ය කලා යෝග්‍යතා (බාහිර) පරීක්ෂණය (ඉංග්‍රීසි විෂය සහිතව) සහ විද්‍යාවේදී (බාහිර) උපාධි පළමු පරීක්ෂණය සමත් ගුරුවරුන් විශ්වවිද්‍යාලවලට ඇතුළත් කිරීම - 2015/2016 අධ්‍යයන වර්ෂය

2015 / 2016 අධ්‍යයන වර්ෂය තුළ පහත සඳහන් පාඨමාලා හැදෑරීම පිණිස ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවලට ඇතුළත් කර ගැනීම සඳහා සාමාන්‍ය කලා යෝග්‍යතා (බාහිර) පරීක්ෂණය (ඉංග්‍රීසි විෂය සහිතව) සහ විද්‍යාවේ දී (බාහිර) උපාධි පළමු පරීක්ෂණය සමත් රජයේ හෝ රජය අනුමත කරන ලද පෞද්ගලික පාසල්වල සේවය කරන ගුරුවරුන්ගෙන් අයදුම්පත් භාර ගනු ලැබේ.

(i) ඉංග්‍රීසි විෂය සහිත කලා උපාධි පාඨමාලාව
(ii) විද්‍යාවේදී උපාධි පාඨමාලාව

2. ඉල්ලුම්කරුවන් මේ සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුයි.

(i) 2011 වර්ෂයේ හෝ ඊට පසු වර්ෂයක දී පැවැත්වූ සාමාන්‍ය කලා යෝග්‍යතා (බාහිර) පරීක්ෂණය (ඉංග්‍රීසි විෂය සහිතව) හෝ විද්‍යාවේ දී (බාහිර) උපාධි පළමු පරීක්ෂණය සමත්ව තිබිය යුතු ය. (ප්‍රතිඵල ලේඛනයේ පිටපතක් අයදුම්පතට ඇමිණිය යුතු ය.)

(ii) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට ගුරුවරයෙකු වශයෙන් අවුරුදු 05 ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු ය. අදාළ ගුරු පත්වීම ස්ථිර කර තිබිය යුතු ය.

(iii) දැනටමත් ගුරු අභ්‍යාස විද්‍යාලයක, ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයක, විශ්වවිද්‍යාලයක හෝ ජාතික අධ්‍යාපන ආයතනයේ පාඨමාලා හැදෑරීම සඳහා ලියාපදිංචි වී නොසිටිය යුතු ය.

(iv) මෙම විශේෂ ප්‍රවේශය යටතේ සිසුන් තෝරා ගනු ලබනුයේ සාමාන්‍ය කලා යෝග්‍යතා (බාහිර) පරීක්ෂණයේ දී (ඉංග්‍රීසි විෂය සහිතව) හෝ විද්‍යාවේදී (බාහිර)උපාධි පළමු පරීක්ෂණයේ දී ලබා ගත් මුළු ලකුණු සහ අදාළ විෂයයට ලබාගත් ලකුණු පදනම් කර ගෙනය. මෙයට අමතරව අදාළ විශ්වවිද්‍යාල මගින් තීරණය කරනු ලබන පරිදි විද්‍යාවේදී උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා සුදුසුකම් ලබන අයදුම්කරුවන් එම විශ්වවිද්‍යාල මඟින් වාචික පරීක්ෂණයකට භාජනය කෙරෙන අතර කලා උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා සුදුසුකම් ලබන අයදුම්කරුවන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කෙරේ.

(v) මෙම පාඨමාලා හැදෑරීම සඳහා තෝරා ගනු ලැබුවහොත් ඔවුනට අධ්‍යයන නිවාඩු ලබා දිය යුතු බැවින් එසේ අධ්‍යයන නිවාඩු හිමිකම් ඇති ගුරුවරුන් පමණක් මේ සඳහා අයදුම් කළ යුතු ය.

3. වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබා ගැනීමට ඇති හිමිකම පිළිබඳව සම්මුඛ පරීක්ෂණයේ දී විමසා බලනු ලැබේ.

4. උපාධි ලබා ගැනීමෙන් අනතුරුව උපාධි ගුරු පත්වීම් ලබාදීම පිළිබඳව වගකීමට මෙම අමාත්‍යාංශය බැඳී නැත.

5. රජය අනුමත කරන පෞද්ගලික පාසල්වල සේවය කරන ගුරුවරුන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත්වල එම පාසලේ විදුහල්පති /කළමනාකරණ තැන විසින් අදාළ ගුරුවරිය /ගුරුවරයා සඳහා අධ්‍යයන නිවාඩු අනුමත කළ හැකි / නොහැකි බව ඉල්ලුම් පත්‍රයේ සඳහන් කළ යුතු ය.

6. රජයේ ගුරුවරුන්ගේ අයදුම්පත් විදුහල්පති, කලාප භාර අධ්‍යාපන අධ්‍යක්ෂ හා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ද, රජය අනුමත කරන ලද පෞද්ගලික පාසල්වල ගුරුවරුන්ගේ අයදුම්පත් අදාළ විදුහල්පති/කළමනාකරණ තැන විසින් ද සහතික කළ යුතු ය.

සෑම අයදුම්පතක්ම මෙහි පහත සඳහන් ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල කොට පිටපත් දෙකකින් (02) යුතුව 2016.07.15 දිනට පෙර ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුවේ. අයදුම්පත් බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ ''ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලවලට ඇතුළත්වීම සඳහා අයදුම්පත් - 2015 / 2016 (ගුරුභවතුන් සඳහා)" යනුවෙන් සඳහන් කළ යුතු ය.

ඩබ්ලිව්. එම්. බන්දුසේන,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

| |
|---|
| |

**ආදර්ශ අයදුම් පත්‍රය**

*අධ්‍යාපන අමාත්‍යාංශය*

*සාමාන්‍ය කලා යෝග්‍යතා (බාහිර) පරීක්ෂණය (ඉංග්‍රීසි විෂය සහිතව) හෝ විද්‍යාවේදී (බාහිර) උපාධි පළමු පරීක්ෂණය සමත් ගුරුවරුන් විශ්වවිද්‍යාලවලට ඇතුළත් කිරීම 2015/2016 අධ්‍යයන වර්ෂය*

1. (i) මුලකුරු සමඟ නම :————.
(ii) සම්පූර්ණ නම :————.

2. ස්ත්‍රී/ පුරුෂ භාවය :————.

3. (i) තනතුර :————. (ii) ශ්‍රේණිය :————.

4. ලිපිනය
(i) රාජකාරි :————.
(ii) පෞද්ගලික :————.

5. දුරකථන අංකය : (i) ස්ථාවර :————.
(ii) ජංගම :————.

6. විද්‍යුත් ලිපිනය (E-mail) :————.

7. වර්තමාන සේවා ස්ථානය :
(i) පාසල :————.
(ii) කලාපය :————.
(iii) දිස්ත්‍රික්කය :————.
(iv) පළාත :————.

8. (i) මුල් පත්වීම් දිනය :————.
(ii) ස්ථිරත්වය ලද දිනය :————.
(iii) සේවා කාලය (මුල් පත්වීමේ සිට අයදුම්පත් භාරගන්නා අවසන් දිනට)ඃ
වර්ෂ :————, මාස :————, දින :————.

9. ගුරුවරයෙකු වශයෙන් ලියාපදිංචි අංකය :————.

10. (i) උපන් දිනයඃ
වර්ෂය :————, මාසය :————, දිනය :————.
(ii) වයස (අයදුම්පත් භාරගන්නා අවසන් දිනට)
වර්ෂ :————, මාස :————, දින :————.

11. සුදුසුකම් ලබන විභාගය පිළිබඳ විස්තරඃ (විශ්වවිද්‍යාලය මගින් නිකුත්කරන ලද අදාළ ප්‍රතිඵල ලේඛනයේ සහතික කරන ලද පිටපතක් අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතුයි.)
(i) විභාගය :————.
(ii) විශ්ව විද්‍යාලය :————.
(iii) ප්‍රතිඵල :————.

| | විෂයය | සමත්වූ වර්ෂය | ලකුණු | ශ්‍රේණිය |
|---|---|---|---|---|
| 1. | | | | |
| 2. | | | | |
| 3. | | | | |
| 4. | | | | |
| 5. | | | | |

12. හැදෑරීමට අපේක්ෂිත උපාධි පාඨමාලාව සහ විෂයයන්ඃ
(i) උපාධි පාඨමාලාවේ නම :————.
(ii) විෂයයන් (1) ————.
(2) ————.
(3) ————.

13. මෙම ප්‍රවේශය යටතේ ඔබව තෝරා ගතහොත් ඇතුළත්වීමට අපේක්ෂා කරන විශ්වවිද්‍යාලවල නම් ඔබගේ කැමැත්තේ අනුපිළිවෙලට සඳහන් කරන්න :
(1) :————. (3) :————.
(2) :————. (4) :————.

14. ඔබ ගුරු අභ්‍යාස විද්‍යාලයක/අධ්‍යාපන පීඨයක/විශ්වවිද්‍යාලයක හෝ ජාතික අධ්‍යාපන ආයතනයේ වෙනත් පාඨමාලාවක් සඳහා ලියාපදිංචි වී සිටී ද? :————.

එසේ ලියාපදිංචි වී ඇත්නම් ඒ පිළිබඳ විස්තර :
…………………………………………………………………
…………………………………………………………………

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

………………………………හිමි/මයා./මිය./මෙනවිය ………දින සිට ………………… ලෙස (තනතුර/ශ්‍රේණිය) ……………………… විද්‍යාලයේ සේවය කරන බවත් ඔහුට/ඇයට පෙර මාසයේ වැටුප ගෙවන ලද්දේ මෙම පාසලෙන් බවත්, යථෝක්ත අධ්‍යයන පාඨමාලාව හැදෑරීම සඳහා ඔහු/ඇය නිදහස් කළ හැකි/නොහැකි බවත් සහතික කරමි.

අයදුම්කරුට/අයදුම්කාරියට අවශ්‍ය අධ්‍යයන නිවාඩු ලබාදීම නිර්දේශ කරමි/නොකරමි.
(අධ්‍යයන නිවාඩු අනුමත නොකරන්නේ නම් හේතු දක්වන්න.)
…………………………………………………………………
…………………………………………………………………
…………………………………………………………………

නිර්දේශ කරමි/නොකරමි.
දිනය :————.
————.
ලිපිනය :————. විදුහල්පති,
(අත්සන හා නිල මුද්‍රාව)

නිර්දේශ කරමි/නොකරමි.
දිනය :————.
————.
ලිපිනය :————. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ,
(අත්සන හා නිල මුද්‍රාව)

නිර්දේශ කරමි/නොකරමි.
දිනය :————.
————.
ලිපිනය :————. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ,
(අත්සන හා නිල මුද්‍රාව)

06-609

---

**සංශෝධනයයි**

**ඉඩම් අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

**මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙහි පැවැත්වෙන මැනුම් ක්ෂෙත්‍ර සහයකයින් පුහුණු කිරීම සඳහා වන ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් 2/3/4(NVQ Level 2/3/4) පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම - 2016/2017 අධ්‍යයන වසර**

උක්ත පාඨමාලාවට බඳවා ගැනීමට අදළව 2016.05.20 දිනැති අංක 1968 දරන *ගැසට් පත්‍රයෙහි* පළ කරන ලද 05-819 දරන නිවේදනයෙහි 3 ඡේදයේ සඳහන් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය 2016.06.24 දින දක්වා දීර්ඝ කරන ලදී.

පී. එම්. පී. උදයකාන්ත,
සර්වේයර් ජනරාල්.

2016 ජුනි මස 10 වැනි දින,

06-934

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.